# 'කතිකා සමූහවල' දෘෂ්ටිවාදාත්මක හරය නූතන බුදු දහමෙහි උන්නතියට කෙසේ අදාළ වේද?

එල්. ඒ. සුනිල් වික්‍රමසිංහ[1]

## හැඳින්වීම

බෞද්ධ දර්ශනය හා ධර්මය ඥාන මාර්ගික විෂයෙන් වියුක්තව ශ්‍රද්ධා විෂයීක සම්ප්‍රදාය තුළ සංස්ථායිතාවට පත් වෙන ආකාරය බෝධි පූජා, භක්ති ගීත, දානමය පුණ්‍යකර්ම, තොරන් හා කවි විරුදු වැනි ආගමික සන්නිවේදන මාධ්‍යය අධ්‍යයනය කරන විට පෙනේ. තත් විෂය භෞතික හා අධිභෞතික ලෝක තුළ සංරක්ෂණ ප්‍රයෝගයට හා ආධ්‍යාත්මික සංවර්ධනයට හේතු වන බව බෞද්ධයන්ගේ විශ්වාසයයි.

සමාජ, දේශපාලනික ධර්මතා හා පුද්ගල සංස්කෘතික ද්විභේදතා අධ්‍යයනය කිරීමේ මූලික න්‍යායක් වශයෙන් අර්ථ විවරණය කළ හැකි 'කතිකා සමූහ' මහා සංස්කෘතිය තුළ සංවිහිතව පවතින අනුසංස්කෘතික පුද්ගල ධූරාවලී අධ්‍යයනය සඳහා මූලික අවධානයක් ලබා දෙන න්‍යායකි. සිංහල බෞද්ධ සම්ප්‍රදාය යටතේ ක්‍රියාත්මක වෙන මරණාධාර සමිති, දායක සභා සමිති, තොරන් හා විරුදු කවි මණ්ඩල නිදසුන් වශයෙන් දැක්විය හැකිය. මෙම අනුජන කතිකා සමූහ කිසියම් භූගෝලීය ප්‍රදේශයක ප්‍රධාන සංස්කෘතියට අමතරව ක්‍රියාත්මක වන විශේෂ චාරිත්‍රමය හා වාරිත්‍රමය අංග ඒකරාශි කරගනිමින් ඥානය නිෂ්පාදනය කරන සමූහ වේ. මෙම ඥාන නිෂ්පාදනය භෞතික හෝ අධිභෞතික හෝ ව්‍යුහයක් තුළ ක්‍රියාකාරී නිවැරදි හෝ නිවැරදි නොවන හෝ සන්දර්භයක් වටා ගොනු විය හැකිය. එසේම භූගෝලීය කලාපයෙන් කලාපයටද එය වෙනස් වේ.

මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් අප අධ්‍යයනය කරනු ලබන්නේ බෞද්ධාගමික කතිකා සමූහ තුළ ක්‍රියාකාරී විශ්වාස සම්මුතීන්වල හරය බුදු දහමෙහි සංවර්ධනයට කෙසේ අදාළ වෙන්නේද යන්න ප්‍රශ්න කිරීමය.

## පර්යේෂණ තොරතුරු

''ධර්ම සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ක්‍රියාත්මක වන 'කතිකා සමූහවල' මතවාද බුදු දහමෙහි හරයට කෙසේ බලපායිද? බුද්ධ දර්ශනයෙහි අභිවෘද්ධියට එම මතවාදයන් සංස්කරණය කළ යුතුද?'' යන ගැටලු ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

---

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, sunilwick2010@gmail.com

තත් කාර්ය සඳහා මවිසින් සකසා ගන්නා ලද උපන්‍යාසයක්ද වෙයි. මුල් බුදු දහම ඥාන මාර්ගය අනුදත් දර්ශනික ශික්ෂණයකි. එහෙත් ලාංකේය බුදු දහමෙහි උන්නතිය ශ්‍රද්ධා මාර්ගික ඥානයද අනුදක්නා ආකාරයක් පෙනෙයි. එවැනි මාර්ගවල ඇතැම් ආනුශාංගික කාරණා සංස්කරණය කිරීම බුදුදහමේ උන්නතිය සඳහා හේතු වන්නකි.

මෙම උපන්‍යාසය ඔස්සේ ගොඩනැගුණු පර්යේෂණ අරමුණු කිහිපයක් උපනිශ්‍රයෙන් තත් ගැටලු විභාග කරනු ලැබේ. කතිකා සමූහ තුළ ක්‍රියාත්මක වෙන ධර්ම සන්නිවේදන මාර්ග බුදු දහමෙහි උන්නතිය සඳහා පමණක් හේතු වන්නේද යන්න අධ්‍යයනය මෙහි මූලික අරමුණ වුවද;

- පුද්ගල සාමූහික නිෂ්පාදනයක් වශයෙන් ව්‍යුහීයකරණයට ලක්වෙන ආගමික විශ්වාසවල පැවැත්ම මෙම කතිකා සමූහ තුළ ක්‍රියාත්මක වෙන ආකාරය අධ්‍යයනය.
- බුද්ධ දර්ශනයෙහි දර්ශනික පැවැත්ම සඳහා එවැනි සන්නිවේදන මෙවළම් දයකත්වයක් සපයන ආකාරය අධ්‍යයනය.
- ඒවාහී න්‍යෂ්ඨිගත වූ දෘෂ්ටිවාද සංස්කරණය කිරීම බුදුදහමෙහි ප්‍රවර්ධනය සඳහා දයක කරගත හැකි ආකාරය, යන අනු අරමුණු ද මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

'කතිකා සමූහයක්' තුළ ක්‍රියාත්මක වෙන මෙවැනි ධර්ම සන්නිවේදන මාර්ග බහුආකාර වශයෙන් ක්‍රියාත්මක වෙයි. අප මෙහිලා මෙම සියලු සන්දර්භයන්ම ආවරණය නොකරන අතර තොරන් හා විරුදු කවි බණ ආශ්‍රයෙන් පමණක් දත්ත රැස් කිරීමට අපේක්ෂා කෙරේ. මෙයට පෙර මෙම සංකල්පය පිළිබඳව ප්‍රාමාණික වශයෙන් හෝ සාකච්ඡා ගොඩනැගී නොමැති බවද සැලකිය යුතුයි. ඒ නිසා සාහිත්‍ය විමර්ශනයේදී 'කතිකා සමූහ' යන සංකල්පය පිළිබඳව දක්වා ඇති න්‍යායික අර්ථ විවරණ ආශ්‍රේය ග්‍රන්ථ මාලාව තුළ දක්වා ඇති ද්විතීයික මූලාශ්‍රය ඔස්සේ විවරණය කරනු ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

පුස්තකාලය සමීක්ෂණය, විද්‍යුත් මූලාශ්‍රය භාවිතය, සහභාගීත්ව නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස් කෙරේ. මෙම විධික්‍රමය යටතේ රැස් කරනු ලබන දත්ත 'කතිකා සමූහ' පිළිබඳ ගොඩනැගෙන න්‍යායික සංකල්ප යටතේ සාකච්ඡා කෙරේ.

## පර්යේෂණ ප්‍රතිඵල

මෙම පර්යේෂණය මගින් අනාවරණය වූ ප්‍රතිඵල මූලික කාරණා කිහිපයක් යටතේ හඳුනාගත හැකි වෙයි.

මූලිකව මෙම පර්යේෂණයෙහි ප්‍රතිඵල සමාජමය අවශ්‍යතා මත නිෂ්පාදනය වූවක් බව පෙනේ. කතිකා සමූහ තුළ නිෂ්පාදනය වන ඇතැම් පොදු විශ්වාස තත් සංස්කෘතික අවශ්‍යතා මත ගොඩනැගෙන්නෙකි. එම සංස්කෘතික අවශ්‍යතා ශ්‍රද්ධා මාර්ගික මාවතක ගමන් කළද බුදු දහමෙහි ආයතනික ව්‍යුහ සංවර්ධනයට එය හේතු වන්නකි. දෙවැන්න බහු ආගමික පැවැත්මක් තුළ බෞද්ධ අනන්‍යතා රෝපණය කිරීමටද එවැනි කතිකා සමූහවල දයකත්වය ආවශ්‍යයික වෙයි.

එසේම පුද්ගලාන්තර උත්කර්ෂණය මතද මෙම කතිකා සමූහවල විශ්වාස පද්ධතීන් ගොඩනැගෙන බව පෙනේ. විශේෂයෙන් ළමා මනසට ආගමික තෘප්තිය ඇති කිරීම, ආගමික වතාවත් සඳහා සහභාගී වීම මානසික පක්ෂයට හේතු වන බවට පවතින විශ්වාසයද හේතුවක් වී ඇත.

මෙම කතිකා සමූහවල සන්නිවේදන ක්‍රියාකාරකම් බෞද්ධ දර්ශනයෙහි අභිවෘද්ධියට හේතු නොවන බව කීව ද එහි සත්‍යතාව නිවැරදි නොවන බව මින් අනාවරණය වූ මූලික කාරණයක් විය. මානසික වශයෙන් ඇතිවන සංවර්ධන අවස්ථා නිසා ඇතැම් පුද්ගලයන් ආරණ්‍යවාසී භික්ෂූන් බවට පත්වෙන අවස්ථාද ඇත.

මීට අමතරව සාරධර්ම හා සදාචාරාත්මක සංවර්ධනය, සාමූහික විශ්වාස පද්ධතීන් හා පුද්ගල කණ්ඩායම් මිත්‍රශීලී බවට පත්වීම, පුද්ගල ශක්‍යතා හා බුද්ධිමය තත්ත්ව වර්ධනය, පුණ්‍යමය හා කුසල්මය තත්ත්ව සංවර්ධනය ආදී තත්ත්වවල සංවර්ධනය මෙහි ප්‍රතිඵල යටතේ සාකච්ඡා කළ හැකිය.

මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අනාවරණය වැදගත්ම කාරණය වශයෙන් දැක්විය හැක්කේ කතිකා සමූහ තුළ ක්‍රියාත්මක වෙන බොහෝ විශ්වාස බුද්ධ දර්ශනයෙහි විවරණිත ලෝකය පිළිබඳ ඥාන මීමංසාත්මක කාරණා අවධි කරන්නට හේතු නොවන බවයි. විශේෂයෙන් ඇතැම් විශ්වාස පද්ධතීන් කේන්ද්‍ර වී වර්ධනය වෙන මතවාද මුල් බුදුසමයෙහි දර්ශනික අවකාශ වෙනත් දිශානතියක් වෙත යොමු කිරීමට උපයුක්ත වෙන බවක් පෙනේ. මෙම කාරණය නිසා අප අනාවරණය කරගත් ප්‍රතිඵල කිහිපයක් වෙයි.

- කතිකා සමූහවල නිෂ්පාදන ආගමෙහි මුල් ප්‍රභවය නව අංශයකට යොමු කරයි.
- බෞද්ධ දර්ශනය පවා අර්ථ විවරණය වන්නේ කතිකා සමූහවල නූතන අරමුණු කේන්ද්‍ර කරගෙනය.
- නූතන ආර්ථික, දේශපාලනික, සංස්කෘතික යන සන්දර්භ ත්‍රය ධූරාවලීගත වන ආකාරය මත එම විශ්වාස ප්‍රතිනිෂ්පාදනය වෙයි.
- කතිකා සමූහ තුළ ක්‍රියාකාරී කාරකයන් වශයෙන් අන්‍ය ආගමිකයන්ද වෙයි.
- මෙම අනුජන කණ්ඩායම්වල විශ්වාස පද්ධතීන් කාලානුරූපීයව වෙනසකට ලක් වෙයි.

**සමාලෝචනය**

කතිකා සමූහ තුළ නිෂ්පාදනය වෙන සන්නිවේදනා ධර්මතාවල පොදු හරය බෞද්ධ සංකල්පවල ප්‍රායෝගික පක්ෂයෙහි වර්ධනයට හේතු වෙන බව පෙනී යයි. විශේෂයෙන්ම දර්ශනිකත්වය සඳහා ගොනු වෙන ඥනාත්මක ඡායා නිෂ්පාදනය එයින් වියුක්ත වෙයි. බුදු දහම සංස්කෘතික, ව්‍යුහාත්මක හා දේශපාලනික වශයෙන් නව සමූහ ධූරාවලී තුළ සංස්ථායිතාවට පත් වීමට එවැනි කතිකා සමූහ හේතු යුක්ත වෙනවා විනා පරම නිෂ්ඨාව අරභයා යොදනු ලබන ඥන විභාගාත්මක කාරණා සඳහා හේතු නොවන බවක්ද පෙනෙයි. එසේම බුදුසමයෙහි ආරම්භක ධර්මතාවලට විපක්ෂව ගොඩනැගෙන ඇතැම් විශ්වාස නිසා ප්‍රායෝගික වශයෙන් බුද්ධ ධර්මයෙහි පිරිසිදු භාවයට අභියෝගයක් එල්ල වී ඇති ආකාරයක් අවබෝධ වෙයි. එම නිසා මෙවැනි කතිකා සමූහ තුළ නිෂ්පාදනය වෙන පොදු විශ්වාස පද්ධතීන් නිසි ආකාරයට සංස්කරණය කිරීම බුද්ධ ධර්මයෙහි මෙන්ම ආගමෙහි ශික්ෂණාත්මක සංවර්ධනයට හේතු වෙන බව කිව හැකිය.

**ප්‍රමුඛ පද** : කතිකා, දෘෂ්ටිවාද, සන්නිවේදනය, ධූරාවලි .

**ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය**


Bazerman, C & Paradis, J. (eds.) (1991). *Textual dynamics of the professions.* Madison: University of Wisconsin Press.

Bazerman, C. (1999). *The languages of Edison's light.* MIT Press.

Berkenkotter, C. & Huckin, T. (1995). *Genre knowledge in disciplinary communication.* Hillsdale, NJ: Lawrence Erlbaum.

Bizzell, P. (1992)' *Academic discourse and critical consciousness.* Pittsburgh: University of Pittsburgh Press.

Swales, J. M. (1990). *Genre analysis: English in academic and research settings*. Cambridge: Cambridge UP.